රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක : PF 443

PF/R/03/Cir.2010
රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.
2010.05. 22

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධානීන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,දිස්ත්‍රික් ලේකම්වරුන්,
සංස්ථා, මණ්ඩල හා ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්.

**විවිධ සේවා සමූපකාර සමිති සතු ඉන්ධන හල්වලින් ණය පදනම මත ඉන්ධන ලබාගැනීම**

විවිධ සේවා සමූපකාර සමිති සතු ඉන්ධන පිරවුම්හල්වලින් රාජ්‍ය ආයතනවලට, ඇනවුම් මත ණයට ඉන්ධන ලබාදී පසුව මුදල් අයකර ගැනීමේ ක්‍රමය වහාම ක්‍රියාත්මක වන පරිදි මෙයින් අත්හිටුවනු ලැබේ. මින් ඉදිරියට රාජ්‍ය ආයතන තම මාසික ඉන්ධන අවශ්‍යතාවය අනුව අදාළ සමූපකාර සමිතිය වෙත තැන්පත් මුදලක් තබා එම තැන්පත් මුදලේ ප්‍රමාණය නොඉක්මවීමේ පදනම මත එම සමිතිය සතු පිරවුම්හල්වලින් ඉන්ධන ලබාගැනීමට ක්‍රියාකළ යුතුය. නොඑසේනම් අත්පිට මුදල් ගෙවා සිය ඉන්ධන අවශ්‍යතාවයන් සපුරා ගත යුතුය.

02. ඉහත ක්‍රියාදාමය අනුගමනය කිරීම මගින් සමූපකාර සමිතිවල කාරක ප්‍රාග්ධන ගැටළු අවම කර ගැනීම අපේක්ෂා කරන බැවින්, රාජ්‍ය ආයතන තම ඉන්ධන අවශ්‍යතා ලබාගැනීමේදී සමූපකාර සමිති සතු ඉන්ධන පිරවුම් හල්වලට ප්‍රමුඛතාවය ලබා දිය යුතුය.

පී.බී. ජයසුන්දර
භාණ්ඩාගාරයේ ලේකම්

පිටපත් :
1. ලේකම්, සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය
2. සමූපකාර සංවර්ධන කොමසාරිස්
3. විගණකාධිපති